# ඓතිහාසික මහඇලගමු කන්ද විහාරය පිළිබඳ අධ්‍යයනය

එම්.එම්.එන්.ටී. හේරත්[19]

---

මහ ඇලගමු කන්ද විහාරය මෙරට ලෙන් විහාර අතුරින් අග්‍රගන්‍ය ස්ථානයකි. මෙය අනුරාධපුර දිස්ත්‍රික්කයේ කැකිරාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇලගමුව ග්‍රාමසේවා වසම තුළ පිහිටා ඇත. මෙම ස්ථානය දඹුල්ල, අනුරාධපුර මාර්ගයේ 04 වැනි සැතපුම් කණුවෙන් හැරී සැතපුම භාගයක් පමණ ගියවිට හමුවේ.මහ ඇලගමුව විහාරයේ ඉතිහාසය විමසීමේ දී අනුරාධපුර යුගය දක්වා දිවයයි. මෙය දෙවන පෑතිස් රජුගේ නිර්මාණයක් බවට මතයක් පළවුවද එය පුරාවිද්‍යාත්මක සාධක වලින් සනාථ වී නොමැත. ක්‍රි.ව. 5-7 සියවස් වලින් අනතුරුව මෙම විහාරයේ පැවැත්ම පිළිබඳ සාධක හමුනොවන අතර ක්‍රි.ව. 7-8 සියවස් වලදී මෙය අතහැර දමා ඇතැයි උපකල්පනය කළ හැකිය. මහනුවර යුගයේ නැවත මෙම විහාරය අලුත් වැඩියා කර ඇත්තේ කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසිනි.මහ ඇලගමු කන්දෙහි ස්ථානගත වී ඇති පුරාවිද්‍යාත්මක අවශේෂ ගැන කතා කිරීමේදී කටාර කෙටූ ගල්ලෙන් 27 ක් ද කටාර නොකෙටූ ගල්ලෙන් 7 ක් ද වේ. එමෙන්ම මෙහි ලෙන් ලිපි, පර්වත ලිපි, අත්ලිපි හමුවේ. ඇලගමුව ලෙන් විහාරය ආශ්‍රිතව ඇති ලෙන් ලිපි 28 ක් පූර්ව බ්‍රාහ්මී ලිපි වන අතර සෙසු ඒවා අතර බ්‍රාහ්මී ලිපි වේ. ක්‍රි.පූ. 3-7 සියවස් වලට අයත් ගිරි ලිපි තුනක් ද වේ. තවද 19 වැනි සියවසට අයත් කුඩා ලිපි දෙකක් හා අත්ලිපි 02 ක් වේ. කඩදාසිවල රචනාකර ඇති මෙම ලිපි වලින් පැරණිතම ලිපිය 1898-06-02 රචනා කර ඇති අතර අනෙක 1893 දී රචනා කර ඇත.මහ ඇලගමු කන්ද විහාරයේ මූර්ති කර්ම මහනුවර හා අනුරාධපුර යුග දෙකම නියෝජනය කරයි. ඒ අනුව සිරි පතුල්ගල් කිහිපයක් හා මුරගල් දෙකක්, පැරණි සඳකඩ පහන් දෙකක්, මල් ආසන කොටස්, ගලින් කල දාගැබ් ආකෘති, බුද්ධ ප්‍රතිමා දේව ප්‍රතිමා ද, සිංහ රූප, දොරටුපාල රූප හමුවී ඇත. උඩරට සම්ප්‍රදායට අනුව ඇඳ ඇති බිතු සිතුවම් ද මෙහි දැකිය හැකි ය. මේවාට තේමාවී ඇත්තේ බුද්ධ චරිතය, වෙස්සන්තර ජාතකය, බුද්ධ රූප, දේව රූප වැනි දෑය. බිතු සිතුවම් වල ප්‍රධාන වර්ණ ලෙස කලු පැහැයට හුරු නිල්, ගුරු, රතු, දුඹුරු, රෝස, සුදු, කලු යන වර්ණයන්ය.ඉහත සඳහන් ඓතිහාසික තොරතුරු සියල්ල කෙරෙහි අවධානය යොමු කරණ විට පැහැදිලි වන්නේ මහඇලගමුව විහාරය කාලවකවානු කීපයකට අයත් පුරාවිද්‍යාත්මක සාධක කේන්ද්‍රණය වූ ඓතිහාසික ස්ථානයක් ලෙස සීගිරි නිම්නයේ ලෙන් විහාර අතරින් අද්විතීය ස්ථානයක් හිමි කර ගන්නා බව ය.

ප්‍රමුඛ පදඃ අත් ලිපි, බිතු ලිපි, ලෙන් විහාර.

---

[19]පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, tharukah9@gmail.com.